# චිත්‍ර කලාව - 09 ශ්‍රේණිය

නිපුණතාවය 5.0 - විවිධ මාධ්‍යය භාවිතයෙන් මූර්ති හා කැටයම් නිර්මාණය කරයි.

නිපුණතා මට්ටම 5.2 - නෙළීමේ ශිල්ප ක්‍රමය භාවිත කර කැටයම්, මූර්ති නිර්මාණය කිරීම.

## ★ ඇඹීම, නෙළීම, එකලස් කිරීම










### නෙළීමේ ශිල්ප ක්‍රමය

**මූර්ති**

- සමාධි ප්‍රතිමාව
- අව්කන ප්‍රතිමාව
- පරාක්‍රමබාහු ප්‍රතිමාව

**කැටයම්**

- වෙස්මුහුණු
- සඳකඩපහණ
- කොරවක්ගල

නෙලීමේ ශිල්ප ක්‍රමය ආශ්‍රයෙන් කැටයම් නෙලීම යනු විමසා බලමු. නිර්මාණයක අවශ්‍යය කොටස් ඉතිරි කර අනවශ්‍යය කොටස් ඉවත් කිරීම නෙලීම නම් වේ.

ඒ ඒ නෙලීමේ ස්වභාවය අනුව හා කැටයම් වල ගැඹුර අනුව කැටයම් වර්ග 03 කට බෙදා වෙන් කරයි.

01) අල්ප උන්නත කැටයම් (ස්වල්පයක් නෙලූ)
02) අර්ධ උන්නත කැටයම් (අඩක් නෙලූ)
03) පූර්ව උන්නත කැටයම් ( සම්පූර්ණව නෙලූ)

නෙලීමේ ක්‍රම සඳහා අතීතයේ ශිල්පීන් යොදාගත් මාධ්‍යය කිහිපයකි. ලී, ගල්, ඇත්දළ, පිත්තල ආදිය ඒ අතර වේ. එසේම වර්තමාණයේ දී සරලව කැටයම් නිර්මාණය සඳහා යොදා ගනු ලබන්නේ සෘජුෆෝම් මාධ්‍යයයි.

එසෙකම් අප පන්තිකාමරය තුළ සරල නව වෙස්මුහුණක් සෘජුෆෝම් මාධ්‍යය උපයෝගි කරගනිමින් නිර්මාණයකර බලමු.

වෙස්මුහුණු වර්ග හඳුනාගනිමු

සාම්ප්‍රදායික වෙස්මුහුණු

01) ශාන්තිකර්ම වෙස්මුහුණු
02) කෝලම් වෙස්මුහුණු

නිර්මාණාත්මක වෙස්මුහුණු

01) ගෝත්‍රික වෙස් මුහුණු
02) සැරසිලි, අලංකරණ වෙස්මුහුණු

# සාම්ප්‍රදායික
# වෙස්මුහුණු



වෙස් මුහුණක නිර්මාණ අවස්ථා










වෙස් මුහුණක් නිර්මාණය කිරීමේ අවස්ථා



රජ සහ බිසව



නාග රාක්ෂ



ගුරුළු රාක්ෂ



නිර්මාණාත්මක වෙස්මුහුණු

ගුණාත්මක යෙදවුම් :-

- රිජිෆෝම් (අඟල් 1ක් ඝණකමකින් යුතු අඟල් 7×5 ප්‍රමාණයේ)
- කඩදාසි
- වර්ණ
- පැන්සල්
- පින්සල්

01 පියවර :- විවිධ වෙස් මුහුණු අධ්‍යයනය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දීම. රූප සටහන් ඉදිරිපත් කිරීම. (සාම්ප්‍රදායික, ගෝත්‍රික, නව නිර්මාණ රූ සටහන්)

02 පියවර :- ඉදිරිපත් කළ නිර්මාණ ඇසුරින් සිසුන්ගේ ස්ව නිර්මාණ අඟල් 7×4 කොටසක් තුළ සංරචනය කිරීමට ඉඩ ලබා දීම.

03 පියවර :- සිසු නිර්මාණ ගුරුවරයාගේ අවධානයට ලක්කර නිර්මාණයන්හි අඩුපාඩු ඇත්නම් නිවැරදි කිරීම.

04 පියවර :- සිසු නිර්මාණ වර්ණ සංකලනය කරමින් සුදුසු පරිදි අලංකාරව නිම කිරීම.



05 පියවර :- එම වර්ණ කළ වෙස්මුහුණු නැවත වරක් කළු සුදු ලෙස වර්ණ කරන්න.



**06 පියවර :-** කළු සුදු නිර්මාණය ගෙන රිජිෆෝම් කැබැල්ල ( අඟල් 7×4 කොටසෙහි) මත තබා ඇඳගන්න. වෙස්මුහුණු නෙලීම ක්‍රමය ඇසුරෙන් කැටයම් කොටස් මතු කරගන්න.
(ඉදිරියට ආ කොස් සුදු වර්ණයෙන් ද පිටුපසට ගිය කොටස් කළු වර්ණයෙන් ද තිබෙන බව දැනුවත් විය යුතුය)

**07 පියවර :-** ඉන්පසු සුදු වර්ණය ගා වියලා ගන්න. පසුව වර්ණ කරගන්න.

